# 12 වසර තුන්වන වාරය නර්තනය ii කොටස

**ර/ශ්‍රී රාහුල මහා විද්‍යාලය ජී.ආර්.ජී.එන්.රත්නායක.**

1. 1 දේශීය තාල හා භාරතීය තාල ලක්ෂණ වල සුවිශේෂතා පැහැදිලි කරන්න.

   2 දේශීය තාල ක්‍රමය හා කර්ණාටක තාල ක්‍රමය අතර සමාන අසමානතා විමසුමට ලක්කරන්න.

   3 හිංදුස්ථානි තාල පද්ධතියට අදාල උදාහරණ 03 දක්වන්න.

2. 1 පහතරට නර්තන සම්ප්‍රධායට අයත් ගර්භ සංරක්ෂණ ශාන්තිකර්මයක් පිලිබඳව විස්තර කරන්න.

   2 එහි ඇති බෞද්ධාගමික පසුබිම පිලිබඳ විග්‍රහ කරන්න.

   3 සමාජ සහජීවනයට ශාන්තිකර්මයෙන් ලැබෙන දායකත්වය පිලිබඳව විස්තරකරන්න.

3. හිංදුස්ථානි , කර්ණාටක සහ දේශිය තාල පද්ධතින්හි සමානකම් මෙන්ම අසමානකම්ද දක්නට ලැබේ.

   1 දාදරා තාලය සහ ත්‍රීතාලය ප්‍රස්තාර කර දක්වන්න.

   2 භරත හා කථක් නර්තන සම්ප්‍රධායන් උදාහරණයට ගෙන ඉහත කියමන සනාථ කරන්න.

   3 ඉහත කියමන කොතෙක් දුරට ගැලපේදැයි සාකච්චා කරන්න

4. කථක් ආගමික භක්තිය ප්‍රකට කරවන නර්තනයක් වන අතර පසු කාලයේ දී රාජසභා නර්තනයක් වශයෙන් වර්ධනය විය.

1 ආගමික නර්තනයක් ලෙස පැවති ආකාරය දක්වන්න.

2 රාජසභා නර්තනයක් වශයෙන් වර්ධනය වු ආකාරය දක්වන්න.

3 රාජසභා නර්තනයක් වශයෙන් වර්ධනය වීමේදී ඇති වු වෙනස්කම් පරීක්ෂා කරන්න.

5. පහත සඳහන් මාතෘකා ඇසුරින් 03 තෝරා විස්තර කරන්න.

1 දේවදාසි සංකල්පය

2 කථක් නර්තනයේ සංගීත සම්ප්‍රධාය හා වාද්‍ය භාන්ඩ

3 තාංජාවූර් සහෝදරයින්

4 මණිපුරි නර්තන සම්ප්‍රධායේ නර්තනාංග

5 කථකලි සම්ප්‍රධායේ වේෂ නිරූපණය

6. පහත වගුවෙන් 1,2,3 කොටස් වලින් කථක් නර්තන සම්ප්‍රදායට අයත් මාතෘකා 1 බැගින් තෝරා ලියන්න.

| 1 | 2 | 3 |
|---|---|---|
| ඇනාපැව්ලොවා | ජතීශ්වරම් | පඛ්වාජය-තබ්ලාව |
| රුක්මණීදේවි | ආමද් | පුංග්-කෝල් |
| නවාබ් වජීඩ්අලීෂා | පදම් | මෘදංගය-නටුවාංගම් |
| නාරායනමෙනන් | රාස්ලීලා | මද්දල-කයිතාලම් |

7. 1 රූපවාහිණිය මගින් ප්‍රචාරය වන නර්තන වැඩසටහන් වල අන්තර්ගත ගායන ,වාදන,චලන,රංගවස්ත්‍රාභරණ හා රංග රචනය පිළිබඳ විචාරාත්මකව දක්වන්න.

2 මෙම වැඩසටහන් වල ගුණාත්මක භාවය ප්‍රදර්ශණය කිරීමට භාවිත කර ඇති තාක්ෂණික විධික්‍රම වල සුවිශේෂ ලක්ෂණ විමසීමට ලක්කරන්න.

3 දේශීය නර්තන සම්ප්‍රධාය වල අනන්‍යතා ලක්ෂණ සුරැකීමට මාධ්‍ය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජනාවලියක් දක්වන්න.

8. 1 බැරිසිල්/පටාචාරා කලාකෘතියක කථාපුවත ඉදිරිපත් කරමින් එහි තේමාව අගයන්න.

2 බැරිසිල්/පටාචාරා කලාකෘතියක ප්‍රාසාංගිකත්වය වර්ධනයෙහිලා සංගීතය බලපා ඇති ආකාරය සඳහන් කරන්න.

3 බැරිසිල්/පටාචාරා තුලින් සමාජයට ලබාදිය හැකි පණිවුඩ පිළිබඳ විමසන්න.

9. 1 රූපවාහිණි වැඩසටහන් ප්‍රේක්ෂක රසවින්දනය සඳහා නිර්මාණය වී ඇති ආකාරය උදාහරණ දෙමින් විමසන්න.

2 රූපවාහිණියේ දක්නට ලැබෙන නර්තන වැඩසටහන්වල සංස්කෘතික අනන්‍යතා ලක්ෂණ පිළිබඳව විමසන්න.

3 රූපවාහිණි නර්තන විචාරකයෙකු සතුවිය යුතු ගුණාංග විමසන්න.

ජී.ආර්.ජී.එන්. රත්නායක.